**මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය - 2017**

------------------------------------------------------------------------------------------

මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 වගන්තිය සහ 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා නියමාවලියේ 26 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණන විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------

මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන පාඨමාලා තුළින් උපයනු ලබන ආදායම් ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 ප්‍රකාරව ගිණුම් සටහන් මඟින් හෙළිදරව් කර නොතිබූ අතර ඒ අනුව පෙර වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.132,000 ක් වූ පාඨමාලා ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් තබා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රදානලාභීන්ගෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු.643,528 ක් වූ මුදලින් රු.193,518 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණ ද එය PhD/mphil Grants Receivable ගිණුමට ගැලපුම් නොකර සමාලෝචිත වර්ෂයට අදාල PhD රාජ්‍ය ප්‍රදාන ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2011 සහ 2014 වර්ෂවල මිලදී ගෙන තිබූ පිළිවෙළින් රු.72,500 ක් සහ රු.140,000 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර 02 ක වටිනාකම එම වර්ෂවල ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට පුනරුත්ථාපන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. තවද ස්ථාවර වත්කම් ලේඛනයට එම වත්කම් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,649,084 ක් වූ භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රු.450,374 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මූල්‍ය ක්‍රියාකාරකම් රු.2,198,710 ක් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.3 නීතී රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලියේ 16 (1) වගන්තිය අනුව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා පූර්ණකාලීන කටයුතු කළ යුතු නිලධාරියෙකු විය යුතු වුවද 2011 වර්ෂයේ සිට විගණිත දින වූ 2018 ජුනි 30 දින දක්වාම එම තනතුර සඳහා පූර්ණ කාලීනව අධ්‍යක්ෂවරයෙකු පත්කර නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු රු.මිලියන 15 ක සහ රු.මිලියන 10 ක මුදල් පිළිවෙලින් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 3 දින සහ ජුනි 29 දිනයන්හි ආපසු ලබා ගෙන තිබුණ ද ඒ සඳහා "රීජන්ට් කවුන්සිලයේ" අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,237,687 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 211,222 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,026,465 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.2,429,760 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.166,709 ක් වූ අතිරික්තය සමාලෝචිත වර්ෂය වනවිට විචලනයක් සහිතව රු.1,237,687 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.10,027,236 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.16,724,789 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

මධ්‍යස්ථානය වෙනුවෙන් පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් අනුව ඇතුළත් කළ යුතු පහත කරුණු ඇතුළත් කර නොතිබුණි.

(අ) අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්යමණ්ඩල විස්තර

(ආ) අදාළ වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතාවය අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) 2017 වර්ෂයට අදාළව පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රධාන ඉලක්ක හා උප අරමුණු ළඟාකර ගැනීමට යොදාගෙන තිබූ උපාය මාර්ග හා ක්‍රියාකාරකම්වල කාර්යසාධනයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දැනටමත් ප්‍රදාන ලබාගෙන අධ්‍යයන කටයුතු කර ගෙන යනු ලබන ප්‍රතිලාභීන් 50 දෙනෙකු වෙත මූල්‍ය පහසුකම් සැපයීමට රු.මිලියන 60 ක් වෙන්කර තිබුණ ද එයින් උපයෝජනය කර තිබුණේ ප්‍රතිලාභීන් 41 දෙනෙකු සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට රු.මිලියන 35 ක් පමණි.

(ii) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 80 දෙනෙකුට ප්‍රදාන ලබාදීමට රු.මිලියන 30 ක් වෙන්කර තිබුණ ද එයින් උපයෝජනය කර තිබුණේ කාර්ය මණ්ඩලයේ 21 දෙනෙකු වෙනුවෙන් ප්‍රදාන ලබාදීමට රු.මිලියන 15 ක් පමණි.

(iii) පරීක්ෂණ කටයුතු සඳහා විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය දිරිමත් කිරීමේ අරමුණින් පාඨමාලා 13 ක් පවත්වා සාමාජිකයින් 300 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කර තිබුණ ද පාඨමාලා 08 ක් පවත්වා සාමාජිකයින් 107 දෙනෙකු පුහුණු කිරීම පමණක් සිදුකර තිබුණි.

(iv) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 40 දෙනෙකු වෙනුවෙන් පරීක්ෂණ කටයුතු සඳහා වැදගත්වන දේශන සංවිධානය කිරීම සහ පරීක්ෂණ දිරිමත්වන අයුරින් පරීක්ෂණ සොයා ගැනීම් ප්‍රසිද්ධ කිරීම යටතේ වූ ක්‍රියාකාරකම් 02 ක් සිදු කිරීමට රු.මිලියන 0.1 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙහි පළමු ක්‍රියාකාරකම යටතේ වූ ආරාධිත දේශන පැවැත්වීම සහ ජර්නල් 02 ක් මුද්‍රණය කිරීම යන කාර්යයන් ඉටු කර නොතිබුණි. එසේම දෙවන ක්‍රියාකාරකමට අදාළව පරීක්ෂණ සම්මන්ත්‍රණයට ඉදිරිපත් කිරීමට උපුටන 200 ක් (Abstract) ඇතුළත් කිරීමට සැලසුම් කර පැවතියද සමාලෝචනය කර මුද්‍රණය කර පැවතියේ උපුටන 48 ක් පමණි.

(v) පරීක්ෂකයන්ගේ දැනීම වැඩිදියුණු කිරීමේ අරමුණින් පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ මධ්‍යගත දත්ත ගබඩා ක්‍රමයක් ඇති කිරීමට රු.මිලියන 3.5 ක් වෙන්කර පැවතියද අදාළ කාර්යය ඉටුකර නොතිබුණි.

(vi) Excel/Access වැඩමුළුව වෙනුවෙන් රු.මිලියන 0.32 ක් වෙන්කර එම මුදලින් 120 දෙනෙකුගේ සහභාගීත්වය මත වැඩසටහන් 05 ක් පැවැත්වීමට සැලසුම් කර පැවතිය ද රු.මිලියන 0.21 ක් වැයකර වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබූ අතර ඒ සඳහා සහභාගීත්වය 46 දෙනෙකු පමණක් විය.

**(ආ) දර්ශනශූරී හා දර්ශනපති උපාධි ප්‍රදාන ලබාදීමේ කාර්යසාධනයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.**

(i) 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා දර්ශනශූරී හා දර්ශනපති උපාධි සඳහා පිරිනමන ලද ප්‍රදානලාභීන් සංඛ්‍යාව 60 සිට 46 දක්වා වූ පරාසයක පැවතියද 2014 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂය අවසාන වන විට ප්‍රදාන ලබාදී තිබුණු ප්‍රදානලාභීන් සංඛ්‍යාව 46 සිට 15 දක්වා පහළ අගයක් ගෙන තිබුණි.

(ii) 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ආයතනය විසින් PhD & Mphil උපාධි සඳහා ප්‍රදාන ලබාදී තිබූ ප්‍රදානලාභීන් 38 දෙනෙකුගේ උපාධි කටයුතු 2016 වර්ෂය අවසාන වන විට නිම කළ යුතු වුවද 2017 වර්ෂය අවසන් වන විටත් ඔවුන්ගේ උපාධි කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. ඒ සඳහා ඔවුන් වෙත ප්‍රදානය කර තිබූ ප්‍රදානයන්ගේ වටිනාකම රු.34,317,407 ක් විය.

(iii) 2006 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මධ්‍යස්ථානය විසින් ප්‍රදානලාභීන් වෙත ලබාදී තිබූ ප්‍රදාන, වලින් උපාධි කටයුතු නිසිපරිදි කරගෙන නොයාම මත අවලංගු කර තිබූ ප්‍රදාන ලාභීන් 04 දෙනෙකුගෙන් මධ්‍යස්ථානයට අයවියයුතු මුදල රු.4,380,044 ක් විය.

**4.2 අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------

වැඩසටහන් 03 ක් සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් 2015 සිට 2017 කාල පරාසය තුල ලබාදී තිබූ එකතුව රු.7,147,509 ක ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතනවල වැඩිවීම රු. 1,395,039 ක් හෙවත් සියයට 35 ක් වී තිබූ අතර අතිකාල ඇතුළු අනිකුත් දීමනාවල වැඩිවීම රු. 3,176,185 ක් හෙවත් සියයට 105 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු සේවක පිරිවැය 2013 වර්ෂයට සාපේක්ෂව රු. 4,571,224 කින් හෙවත් සියයට 65 කින් වැඩිවී තිබූ අතර ඒක පුද්ගල සේවක පිරිවැයෙහි වැඩිවීම 2013 වර්ෂයට සාපේක්ෂව රු464,827 ක් හෙවත් සියයට 92 ක් විය.

(ඇ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වාර්ෂික වැටුප් හා වේතනවල වටිනාකම අතිකාල හා අනෙකුත් දීමනාවලට දක්වන ප්‍රතිශතය 2013 සිට 2017 දක්වා පිළිවෙළින් සියයට 75 ක, 102 ක, 165 ක,157 ක හා 114 ක ඉහළ ප්‍රතිශතයක් විය.

**5. තිරසාර සංවර්ධනය**

**---------------------**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම**

**-----------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 අගෝස්තු 14 දිනැති හා අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛ ලිපිය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රය” ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයන් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර ‘2030 න්‍යාය පත්‍රය’ පිළිබඳ මධ්‍යස්ථානය දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වියයුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

**----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍රය** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) ප්‍රදාන හා පාඨමාලා සම්බන්ධ අභ්‍යන්තර පාලනය | ප්‍රදාන ලබාදී ඇති ප්‍රදානලාභීන්ගේ උපාධි කටයුතු නියමිත කාල වකවානු ඇතුළත සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කිරීම සහ ඒ අනුව කටයුතු නොකරන ප්‍රදාන ලාභීන් වෙත ලබාදී ඇති ප්‍රදාන නැවත අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ආ) සැලසුම් කිරීම | ක්‍රියාකාරී සැලැස්මේ අපගමනයන් අවම කර අදාළ ඉලක්ක කරා ළඟාවිය හැකි අයුරින් කටයුතු කර නොතිබීම. |